// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2092/10 - 2018 ඔක්තෝබර් මස 08 වැනි සඳුදා - 2018.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

මහා නගර සභා නියෝග

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 289(1) වන උප වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 188(1) (කක) වගන්තිය යටතේ වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි මහ නගර සභාවල සභිකයන් සඳහා වන ප්‍රවාහන දීමනා ගෙවීමට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ.

**ඩී. ජී. බී. එම්. ධර්මසිරි දසනායක,**
වයඹ පළාතේ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා
පළාත් පරිපාලන, ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 28 වැනි දින,
කුරුණෑගල පිහිටි වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග වයඹ පළාතේ පිහිටි මහා නගර සභාවල සභිකයන් සඳහා ප්‍රවාහන දීමනා ගෙවීමට අදාළ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.
2. මහා නගර සභාවල සභිකයන් සඳහා මහා සභාවේ විධිමත් යෝජනා සම්මතයක් මගින් මසකට රු. 3000.00ක උපරිමයකට යටත්ව ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකිය.
3. මෙම දීමනා සභා අරමුදලින් ගෙවිය යුතු අතර ඒ සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබිය යුතුය.
4. (අ) පහත සඳහන් අවස්ථාවන්හිදී මහා නගර සභා සභිකයන් ප්‍රවාහන දීමනා සඳහා හිමිකම් නොලබයි.
    (i) දීමනා ගෙවීමට අදාළ මාසයේ පවත්වන ලද මහා සභා රැස්වීමට සහ කාරක සභා රැස්වීම්වලට මහා සභාවේ අනුමැතියකින් තොරව සහභාගි නොවීම;
    (ii) කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටීම;
    (iii) මහා නගර සභා ආඥාපනතේ 277 වගන්තිය යටතේ යම් මහා නගර සභාවක සභිකයන්ගේ කාර්යය හා කටයුතු අත්හිටුවා තිබීම.

PG 4269 — 12 (2018/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේ වුවද, රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටි නිවාඩු ලබා සිටි හෝ කාර්යය හා කටයුතු අත්හිටුවා සිටි කාලය යම් මාසයකින් කොටසක් වන අවස්ථාවකදී එම මාසයේ ඉතිරි කාලය සඳහා අනුපාතිකව ගණන් බලා මෙම දීමනා ගෙවිය හැකිය.

(ආ) මෙම නියෝගයේ 4(අ) ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද, සභිකයින් රාජකාරි කාර්යයන් සඳහා සභාවේ විධිමත් අනුමැතියකින් යුතුව නිරතවන අවස්ථාවක සභා රැස්වීමට සහභාගී නොවීම මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතුය.

10 - 1248/1

---

**වයඹ පළාතේ පළාත් සභාව**

**නගර සභා රීති**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 193 (1) වන උප වගන්තිය හා 193 (2) (උඋ) උපවගන්තිය යටතේ වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි නගර සභාවල සභිකයන් සඳහා වන ප්‍රවාහන දීමනා ගෙවීමට අදාළ රීති මෙයින් පනවනු ලැබේ.

**ඩී. ජී. බී. එම්. ධර්මසිරි දසනායක,**
වයඹ පළාතේ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා
පළාත් පරිපාලන, ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 28 වැනි දින,
කුරුණෑගල පිහිටි වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**නගර සභා රීති**

1. මෙම රීති වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි නගර සභාවල සභිකයන් සඳහා ප්‍රවාහන දීමනා ගෙවීමට අදාල රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. අදාල නගර සභාවල සභිකයන් සඳහා මහා සභාවේ විධිමත් යෝජනා සම්මතයක් මගින් මසකට රු. 3000.00ක උපරිමයකට යටත්ව ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකිය.

3. මෙම දීමනා සභා අරමුදලින් ගෙවිය යුතු අතර ඒ සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබිය යුතුය.

4. (අ) පහත සඳහන් අවස්ථාවන්හිදී නගර සභා සභිකයන් ප්‍රවාහන දීමනා සඳහා හිමිකම් නොලබයි.
   (i) දීමනා ගෙවීමට අදාල මාසයේ පවත්වන ලද මහා සභා රැස්වීමට සහ කාරක සභා රැස්වීම්වලට මහා සභාවේ අනුමැතියකින් තොරව සහභාගි නොවීම;
   (ii) කිසියම් සාපරාධී චෝදනාවකට අදාලව රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටීම;
   (iii) නගර සභා ආඥා පනතේ 184 වගන්තිය යටතේ යම් නගර සභාවක සභිකයන්ගේ කාර්යය හා කටයුතු අත්හිටුවා තිබීම.

එසේ වුවද, රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටි නිවාඩු ලබා සිටි හෝ කාර්යය හා කටයුතු අත්හිටුවා සිටි කාලය යම් මාසයකින් කොටසක් වන අවස්ථාවකදී එම මාසයේ ඉතිරි කාලය සඳහා අනුපාතිකව ගණන් බලා මෙම දීමනා ගෙවිය හැකිය.

(ආ) මෙම රීතියේ 4(අ) ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද, සභිකයින් රාජකාරි කාර්යයන් සඳහා සභාවේ විධිමත් අනුමැතියකින් යුතුව නිරතවන අවස්ථාවක සභා රැස්වීමට සහභාගි නොවීම මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතුය.

10 - 1248/2

## වයඹ පළාතේ පළාත් සභාව

### ප්‍රාදේශීය සභා රීති

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 (1) වන උප වගන්තිය හා 184 (1) (ඊ) උප වගන්තිය යටතේ වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය සභාවල සභිකයන් සඳහා වන ප්‍රවාහන දීමනා ගෙවීමට අදාල රීති මෙයින් පනවනු ලැබේ.

**ඩී. ජී. බී. එම්. ධර්මසිරි දසනායක,**
වයඹ පළාතේ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා
පළාත් පරිපාලන, ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 28 වැනි දින,
කුරුණෑගල පිහිටි වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

### ප්‍රාදේශීය සභා රීති

1. මෙම රීති වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය සභාවල සභිකයන් සඳහා ප්‍රවාහන දීමනා ගෙවීමට අදාල රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. අදාල ප්‍රාදේශීය සභාවල සභිකයන් සඳහා මහා සභාවේ විධිමත් යෝජනා සම්මතයක් මගින් මසකට රු. 3000.00ක උපරිමයකට යටත්ව ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකිය.

3. මෙම දීමනා සභා අරමුදලින් ගෙවිය යුතු අතර ඒ සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබිය යුතුය.

4. (*අ*) පහත සඳහන් අවස්ථාවන්හිදී ප්‍රාදේශීය සභා සභිකයන් ප්‍රවාහන දීමනා සඳහා හිමිකම් නොලබයි.
   (i) දීමනා ගෙවීමට අදාල මාසයේ පවත්වන ලද මහා සභා රැස්වීමට සහ කාරක සභා රැස්වීම්වලට මහා සභාවේ අනුමැතියකින් තොරව සහභාගි නොවීම;
   (ii) කිසියම් සාපරාධී චෝදනාවකට අදාලව රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටීම;
   (iii) ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ යම් ප්‍රාදේශීය සභාවක සභිකයන්ගේ කාර්යය හා කටයුතු අත්හිටුවා තිබීම.

එසේ වුවද, රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටි නිවාඩු ලබා සිටි හෝ කාර්යය හා කටයුතු අත්හිටුවා සිටි කාලය යම් මාසයකින් කොටසක් වන අවස්ථාවකදී එම මාසයේ ඉතිරි කාලය සඳහා අනුපාතිකව ගණන් බලා මෙම දීමනා ගෙවිය හැකිය.

(*ආ*) මෙම රීතියේ 4(අ) ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද, සභිකයන් රාජකාරි කාර්යයන් සඳහා සභාවේ විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමට සහභාගි නොවීම මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතුය.

10 - 1248/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.